දැනගෙන රට යන්න
1989 අමතන්න

# RATA රැකියා
FOREIGN EMPLOYMENT NEWS

Volume 01 Issue 01
March - August

# ඉටුකම සෞඛ්‍ය අරමුදලට කාර්යාංශ සේවකයන්ගෙන් මිලියන 1.8 පරිත්‍යාගයක්

ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතාගේ සංකල්පයකට අනුව ආරම්භකරන ලද ඉටුකම කොවිඩ්-19 සෞඛ්‍ය හා සමාජ ආරක්ෂණ අරමුදලට, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සේවකයන් විසින් සිය දෛනික වැටුපෙන් පරිත්‍යාග කරන ලද රුපියල් මිලියන 1.8 ක මුදලට අදාල චෙක්පත, 2020.06.10 දින විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති කමල් රත්වත්තේ මහතා විසින් ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා වෙත භාරදෙන ලදී.

මෙම අවස්ථාවට අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ, විදේශ සබඳතා නිපුණතා සංවර්ධන රැකීරක්ෂා හා කම්කරු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන, නිපුණතා සංවර්ධන රැකීරක්ෂා හා කම්කරු අමාත්‍යාංශයේ ලේකම් සරත් අබේවර්ධන යන මහත්වරු එක්ව සිටියහ.

## කොරෝනා සමයේ මත්තල - සෝල් නුවර එක්වෙයි

**"විදේශ රැකියා සඳහා ඉදිරියේදී වැඩි පිරිසක් මත්තලින් පිටත් කිරීමට බලාපොරොත්තු වෙනවා..."**

**කමල් රත්වත්තේ - විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති**

(2020.05.27 - මත්තල)

මත්තල රාජපක්ෂ ජාත්‍යන්තර ගුවන්තොටුපොලින් ඉදිරියේදී ශ්‍රමිකයන් වැඩි පිරිසක් පිටත්කිරීමට බලාපොරොත්තු වන බව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති කමල් රත්වත්තේ මහතා ප්‍රකාශ කළේය. ඔහු මෙම අදහස් පළකළේ, නිවාඩු සඳහා මෙරටට පැමිණ සිටි කොරියානු රැකියාලාභීන් පිටත්වීමේ විශේෂ අවස්ථාවට එක්වීමට ගුවන් තොටුපොලට පැමිණි අවස්ථාවේදීය.

විදේශ රැකියා ක්ෂේත්‍රය නැවත මේ ලෙස පණ ගන්වමින් ශ්‍රමිකයන් විදේශ රැකියා සඳහා යොමු කිරීමට විදේශ සබඳතා නිපුණතා සංවර්ධන රැකීරක්ෂා හා කම්කරු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා ලබාදුන් මාර්ගෝපදේශයට අනුව යමින් මෙම පිරිස් ඉක්මණින් රැකියා සඳහා යොමු කිරීමට කාර්යාංශයට හැකිවිය.

දකුණු කොරියාවේ රැකියාවල නිරත වී නිවාඩු ලබා යළි මෙරටට පැමිණ නැවත පිටත්ව යාමට නොහැකිව සිටි පිරිස් තමන්ගේ සේවා ස්ථාන වෙත නැවත පිටත් කිරීමේ වැඩිපිළිවෙල යටතේ මෙම ශ්‍රමිකයන් මෙලෙස යොමුකිරීම සිදුකෙරිණි. ඔවුන් එරටදී දින 14ක නිරෝධායන අවශ්‍යතා සඳහාද යොමුකිරීමට කාර්යාංශය හා කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනය පහසුකම් හා ක්‍රමවේද සකසා තිබේ. මෙම ශ්‍රමික පිරිස වඩාත් සෞඛ්‍යාරක්ෂිතව ඉතා පහසුවෙන් විදේශ ගතවීමට මත්තල ගුවන්තොටුපලින් පහසුකම් ලැබී තිබේ.

එහිදි වැඩිදුරටත් අදහස් දැක්වූ රත්වත්තේ මහතා මෙසේද පැවසීය.

කොරෝනා වසංගතයෙන් ලෝකයම පීඩාවට පත්වී ඇති අවස්ථාවක රැකියා අහිමිවීමක් සිදු නොකරගෙන ලංකාවෙන් කොරියාවට ශ්‍රමිකයින් 160 දෙනෙකු පිටත් කිරීමට කාර්යාංශයට හැකියාව ලැබුණා. - 02 පිටුවට

## ඩුබායි හා උතුරු එමිරේට්ස් හි ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට වියළි ආහාර බෙදාදෙයි...

- 02 පිටුවට

## කොරෝනා හේතුවෙන් අපහසුතාවට පත් ශ්‍රමිකයන්ට මිලියන 03ක සහනාධාර ලබාදීමට ඇමති දිනේෂ්ගෙන් යෝජනාවක්..

- 02 පිටුවට

## නිවාඩු මත දිවයිනට පැමිණ සිටින ශ්‍රමිකයන්ගේ රැකියා සුරක්ෂිත කෙරේ..

- 04 පිටුවට

## විගමනික ශ්‍රමිකයන් ඇතුළු ලෝකවාසීන් වෙනුවෙන් ආශිර්වාද පූජාවක්...

''කොරෝනා වසංගතය ලොවෙන් තුරන් කරමු'' තේමා කරගනිමින් එම වෛරසය හේතුවෙන් පීඩාවට පත්ව සිටින ලොව පුරා ජනතාවට හා විගමික ශ්‍රමිකයන්ට සෙත් ප්‍රාර්ථනා කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සංවිධාන කරනු ලැබූ මල් පහන් පූජාව හා සෙත් පිරිත් සජ්ජායනය මුල් කරගත් ආශිර්වාද පූජාවක් 2020.03.14 වැනිදා වෙහිහාසික කෝට්ටේ රජමහා විහාරස්ථානයේ දී පැවැත්විණි. එහිදී විහාරාධිපති අළුත්නුවර අනුරුද්ධ මහානාහිමි ඇතුළු 30 කට ආසන්න මහා සංඝරත්නය ආශිර්වාද පූජාව පැවැත්වූහ.

මෙම ආශිර්වාද පූජාව නිපුණතා සංවර්ධන, රැකී රක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාගේ සහභාගීත්වයෙන් පැවති අතර මේ සඳහා ඉතාලි තානාපතිනි රිටා ගිවිලියානා මනෙලා (Rita Giuliana mannell), මාලදිවයින් මහකොමසාරිස් ඕමාර් අබ්දුල් රසාක් (Omar Abdul Razzak), අමාත්‍යාංශ ලේකම්, කාර්යාංශ සභාපති, බලපත්‍රලාභී රැකියා නියෝජිත ආයතන වල නියෝජිතයෝ ඇතුළු කාර්යාංශයේ නිලධාරීහු රැසක් හා අවට දායක සභාව ද එක්වූහ.

## නිවාඩු මත දිවයිනට පැමිණ සිටින ශ්‍රමිකයන්ගේ රැකියා සුරක්ෂිත කෙරේ..

(01 පිටුවෙන්)

නිවාඩු මත මව්රටට පැමිණ සිටින විදේශ රැකියාවන්හි නියුතු වූ ශ්‍රී ලාංකිකයින් හට **Covid 19** වසංගත තත්ත්වය මත ලොව පුරා පනවා ඇති ගුවන් හා වෙනත් සීමාවන් නිසා පෙරළා තම සේවා ස්ථාන වෙත යාමේ අපහසුතාවයක් ඇත. මෙම තත්ත්වය මත ඔවුන්ගේ රැකියා අහිමිවීමේ අවදානමක් පවතී. එබැවින් නිවාඩු මත මව් රටට පැමිණ සිටින විදේශ රැකියාලාභීන් ඇතිවී තිබෙන තත්ත්වය පිළිබඳ තම හාම්පුතා සමග තොරතුරු හුවමාරු කරගනිමින්, මෙම පවතින බාධක ඉවත්වීමෙන් පසු තම රැකියා අවස්ථාව භාරගැනීමට පැමිණෙන බව දැනුම්දී තහවුරුවක් ලබාගැනීමට කටයුතු කරන මෙන් කාර්යාංශය විසින් විදේශ රැකියාලාභීන්ගෙන් ඉල්ලා සිටී.

තවද එසේ තම හාම්පුතුන් හා සම්බන්ධ වීමට අපහසු ශ්‍රමිකයන් සිටී නම්, එම රටවල විදේශ තානාපති කාර්යාලයන්හි කම්කරු අංශ වෙත පහත සඳහන් විස්තර තැපැල් ලිපිනයන් මගින්, තොරතුරු හුවමාරු කරගන්නා ලෙස ඉල්ලා සිටියි. එම තොරතුරු සමග නම, ගමන් බලපත්‍ර අංකය හා හාම්පුතාට ඇමතිය හැකි දුරකථන අංක ඇතුළත් තොරතුරු දන්වා සිටින මෙන් කාර්යාංශය ඉල්ලා සිටී.

එමෙන්ම **www.slbfe.lk** කාර්යාංශ වෙබ් අඩවියේ මෙම කාර්යය වෙනුවෙන්ම සකස් කොට ඇති **Migrant workers on vacation** වෙබ් ද්වාරය (**web portal**) මගින් තම තොරතුරු කාර්යාංශය වෙත ලබාදීම ද සිදුකළ හැකි අතර, එමගින් අවශ්‍ය සහයෝගය ඉල්ලා සිටිය හැක.

## සුබපැතුම්

**කම්කරු අමාත්‍ය**
**නීතිඥ නිමල් සිරිපාල ද සිල්වා මැතිතුමා**

**විදේශ රැකියා ප්‍රවර්ධන හා වෙළඳපල විවිධාංගිකරණ රාජ්‍ය අමාත්‍ය**
**පියංකර ජයරත්න මැතිතුමා**

## විදේශ රැකියා ලියාපදිංචිය තවත් රටවල් හතරකට ව්‍යාප්ත කෙරෙයි..

විදේශ රැකියා සඳහා පිටත්වීමට බලාපොරොත්තුවන ශ්‍රී ලාංකිකයන් ලියාපදිංචි කිරීමේ කටයුතු අදියර කිහිපයක් යටතේ ආරම්භ කළ අතර, එහි දෙවන අදියර ලෙස හොංකොං, රුමේනියා, පෝලන්තය හා චෙක් රාජ්‍යයට අදාල ලියාපදිංචි කිරීම අද සිට (2020.06.17) යළි ආරම්භ කරන බව එහි සභාපති කමල් රත්වත්තේ මහතා සඳහන් කරයි.

ඉහත රටවල රැකියා සඳහා ශ්‍රී ලාංකික රැකියා අපේක්ෂිතයන් බඳවා ගැනීමට අදාල මාධ්‍ය දැන්වීම් පළකිරීමට, බලපත්‍රලාභී රැකියා නියෝජිතායතනවලට අනුමැතියද මේ සමග හිමිවේ. ප්‍රමාදයකින් තොරව විදේශ රැකියා ක්ෂේත්‍රය ප්‍රවර්ධනය කරමින් රැකියා සඳහා පිටත්ව යාමට උනන්දු ශ්‍රී ලාංකික රැකියා අපේක්ෂිතයින්ට ඒ සඳහා පහසුකම් නොපමාව සලසමින් ආර්ථිකය පණගැන්වීම සඳහා නිපුණතා සංවර්ධන, කම්කරු සුභසාධන හා විදේශ කටයුතු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන අමාත්‍යතුමන් විදේශ සේවා නියුක්ති කාර්යාංශයට ලබාදුන් උපදෙස් අනුව යමින් රැකියා සඳහා ලියාපදිංචිය මෙසේ වේගවත් කර ඇත.

ලොව පුරා කොරෝනා වෛයිරසය ව්‍යාප්තවීම හේතුවෙන් පසුගිය මාර්තු 13 වැනිදා සිට විදේශ රැකියා සඳහා පිටත්වන්නන් ලියාපදිංචි කිරීම තාවකාලිකව අත්හිටිවූ අතර, වයිරසය යම්තාක් දුරට පාලනයවීම හා විදේශ රැකියා නියෝජිතායතන මෙන්ම ශ්‍රමික ප්‍රජාව විසින් සිදුකරන ලද ඉල්ලීම් සලකා බලා කාණ්ඩ වශයෙන් විදේශ රැකියා සඳහා ලියාපදිංචිකිරීම් යළි ආරම්භ කිරීමට කාර්යාංශය විසින් පියවර ගන්නා ලදී.

විදේශගත වීමට අනුමැතිය ලබාදීමේ ප්‍රථම අදියර මැයි 20 වෙනි දින සිට යළි ආරම්භ කළ අතර, ඒ අනුව දකුණු කොරියාව, ජපානය, කැනඩාව හා ජර්මනිය යන රටවල රැකියා සඳහා අවශ්‍ය අනුමැතිය ලබාදී තිබේ. මේ අනුව විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ප්‍රධාන කාර්යාලය හා සියලුම පළාත් කාර්යාල, දිස්ත්‍රික් කාර්යාලවල සාමාන්‍ය රාජකාරී ආරම්භ කර ඇති බැවින් රැකියා සඳහා ලියාපදංචි කිරීම් ද එම ස්ථානවලදී සිදුකෙරේ. එහිදී විදේශ රැකියාවක නිරතව සිට දැනට නිවාඩු ලබා පැමිණ සිටින, නැවත තම රැකියා ස්ථානවලට යාමට බලාපොරොත්තුවන අය ලියාපදිංචියට ප්‍රමුඛත්වය ලබාදේ.

විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීමට අදාල සෙසු නිතී රීති සාමාන්‍ය පරිදිම ක්‍රියාත්මක වන අතර, මැදපෙරදිග හා සෙසු රටවලට අදාල විදේශ රැකියා සඳහා ලියාපදිංචි කිරීම් ඉදිරියේදී ආරම්භ කිරීමටද නියමිතය.

## කොවිඩ් 19 වයිරසයේ බලපෑම හේතුවෙන් පීඩාවටපත් විගමනික ශ්‍රමිකයන්ට තානාපති හා කොන්සල් කාර්යාල කම්කරු හා සුබසාධන අංශ මගින් වියළි ආහාර හා සහනාධාර ලබාදීම

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - සවුදි අරාබිය
රියාද් කාර්යාලය

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - අබුඩාබි

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - බිමානය

ශ්‍රී ලංකා කොන්සල් ජනරාල් කාර්යාලය -
එක්සත් අරාබි එමිරේට් හා උතුරු එමිරේට්ස්

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - කුවෙට්

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - රියාදය

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - ජෝර්දානය

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - කටාර්

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - ලෙබනන්

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය - මැලේසියාව

ශ්‍රී ලංකා මහ කොමසාරිස් කාර්යාලය - සිංගප්පූරුව

ශ්‍රී ලංකා තානාපති කාර්යාලය
සවුදි අරාබිය -ජෙඩා කාර්යාලය

**නිතර මුව ආවරණ පළඳින්න - කොවිඩ් ශ්‍රී ලංකාවෙන් තුරන් කරමු**

ප්‍රචාරක හා මහජන සම්බන්ධතා අංශය - ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# ඩුබායි හා උතුරු එමිරේට්ස් හි ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ට වියළි ආහාර බෙදාදෙයි...

(01 පිටුවෙන්)

කොරෝනා වයිරසය ව්‍යාප්තිය හේතුවෙන් අපහසුතාවයට පත්ව විදේශ රටවල සිටින විගමනික ශ්‍රමිකයන්ට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ උපදෙස් මත පහසුකම් ලබාදීමේ වැඩසටහන යටතේ ඩුබායි හා උතුරු එමිරේට්ස් හි ශ්‍රී ලාංකික විගමනික ශ්‍රමිකයන්ට වියළි ආහාර ලබාදීම තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශය විසින් පසුගියදා සිදුකරන ලදි.

මෙහිදි එමිරේට්ස්, ඩුබායි. සාජා, රෝයල් කායිමා, අජ්මාන් වැනි ප්‍රදේශවල සිටින විගමනික ශ්‍රමිකයන්ට වියළි ආහාර ලබාදීමට කඩිනමින් කටයුතු යොදා තිබිණි. කර්මාන්ත ශාලා තාවකාලිකව වසා දැමීම නිසා අපහසුතාවට පත්ව සිටින ශ්‍රමිකයන් හා නීති විරෝධීව රැඳිසිටින ශ්‍රමිකයන්ට මේ අනුව වියළි ආහාර ලබාදීම මෙසේ සිදුකර තිබේ.

මෙම අවස්ථාවට ඩුබායි හා උතුරු එමිරේට්ස් තානාපති කාර්යාලයේ කම්කරු සුභසාධන අංශය භාර කොන්සල් ජනරාල් ඉන්දිරා පතිනායක මහත්මිය ඇතුළු තානාපති අංශයේ නිලධාරිහු එක්ව සිටියහ.

# ඇමති දිනේෂ් ගුණවර්ධන මහතා මෙරට එක්සත් ජාතීන්ගේ නේවාසික නියෝජිතවරිය ඇතුළු ජාත්‍යන්තර සංවිධාන නියෝජිතයන් හමුවෙයි

(2020.04.28 - කොළඹ)

විදේශ සබඳතා, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා (2020.04.28) මෙරට එක්සත් ජාතීන්ගේ නේවාසික නියෝජිත හානා සින්ගර්, ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ මෙරට අධ්‍යක්ෂිකා සිම්රින් සිංග් යන මහත්මීන් හා ජාත්‍යන්තර විගමනික සංවිධානයේ මෙරට අධ්‍යක්ෂ සරථ් ඩාෂ් මහතා හමුවීය. නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු අමාත්‍යාංශයේ පැවති මෙම හමුවේදී කොරෝනා වසංගතය හේතුවෙන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය, ව්‍යාපාර, දේශීය විදේශීය රැකියා ක්ෂේත්‍රයට කෙරෙන බලපෑම් සහ ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සිදුකිරීමට සහයවීම සඳහා යාන්ත්‍රණයක් සැකසීම ගැන සාකච්ඡා කෙරිණි.

කොරෝනා වයිරස බලපෑම හේතුවෙන්, ශ්‍රී ලංකාවේ නිෂ්පාදන ව්‍යාපාර මෙහෙයුම් කඩාවැටීමේ ගැටලු, කුඩා හා මධ්‍ය පරිමාණයේ ව්‍යවසායකයන් මුහුණපාන ගැටලු හා කාරක ප්‍රාග්ධනය මෙන්ම සේවක ගැටලු සම්බන්ධවද මෙහිදි අවධානය යොමුවිය. තවද විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ ලියාපදිංචි නොවූ විගමණික ශ්‍රමිකයන්, රැකියා අහිමිවුවන් සහ පරියේෂණ ගැටලු සම්බන්ධවද මෙම හමුවේදී සාකච්ඡා විය.

එසේම මෙම අභියෝගාත්මක අවස්ථාවේදී විදේශ රැකියාවල නිරතව සිටින ශ්‍රමිකයන් හා දේශීය ශ්‍රමිකයන්ගේ අයිතිවාසිකම් වෙනුවෙන් පෙනී සිට ඔවුන්ට සහයදීම සඳහා රජය සෑම පියවරක්ම ගන්නා බව අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා මෙම අවස්ථාවේදී ප්‍රකාශ කළේය.

අමාත්‍ය ගුණවර්ධන මහතා වැඩිදුරටත් කියා සිටියේ, කොරෝනා වසංගතය ව්‍යාප්තවීම හේතුවෙන් කඩාවැටී ඇති ආසියානු කලාපීය ආර්ථිකය පණගැන්වීම සඳහා සංවර්ධන උපායමාර්ගික සැලසුමක අවශ්‍යතාවද මේ අවස්ථාවේ පවතින බවය.

මෙම වසංගත අවස්ථාවේදී එය මනාව කලමනාකරණය කිරීමට ශ්‍රී ලංකා රජය ගත් ක්‍රියාමාර්ග අගය කළ එක්සත් ජාතීන්ගේ මෙරට නේවාසික නියෝජිත හානා සින්ගර් මහත්මිය, ශ්‍රී ලංකා රජයට ඒ වෙනුවෙන් ප්‍රශංසාව පළකරන බවද ප්‍රකාශ කළාය. එමෙන්ම විගමනික ශ්‍රමික කටයුතු හා සුභසාධන පහසුකම් ලබාදීම සම්බන්ධව එක්සත් ජාතීන්ගේ සංවිධානය, ජාත්‍යන්තර කම්කරු සංවිධානය, හා ජාත්‍යන්තර විගමනික සංවිධානය යන ආයතනවල මාර්ගෝපදේශන සහය ඇතිව ජාතික සැලැස්මක් ක්‍රියාත්මක කිරීමේ වැදගත්කමද ඇය පෙන්වා දුන්නාය.

මෙම සාකච්ඡාවට නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු අමාත්‍යාංශයේ ලේකම් එස්. අබේගුණවර්ධන, කම්කරු කොමසාරිස් ජෙනරාල් ඒ. විමලවීර, විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති කමල් රත්වත්තේ, යන මහත්වරුන් හා උසස් නිලධාරිහු එක්ව සිටියහ.

# "විදේශ රැකියා සඳහා ඉදිරියේදී වැඩි පිරිසක් මත්තලින් පිටත් කිරීමට බලාපොරොත්තු වෙනවා..."

**කමල් රත්වත්තේ - විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති**

(01 පිටුවෙන්)

විශේෂයෙන් මෙම අවස්ථාව ලබාගැනීම සඳහා ජනාධිපතිතුමා, අගමැතිතුමා සහ විෂය භාර අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මැතිතුමා දැක්වූ සහය අගය කරනවා. ඉදිරියේදී මත්තල ගුවන් තොටුපොලින් කොරියාවට ශ්‍රමිකයන් පිටත් කිරීමට මෙන්ම කොරියාවේ සිට මත්තල වෙත ශ්‍රමිකයන් ගෙන්වීමට බලාපොරොත්තු වෙනවා. එසේම මත්තල ගුවන් තොටුපොලින් විදේශ රැකියාලාභීන් වැඩි පිරිසක් විදේශ ගතකිරීමට බලාපොරොත්තු වෙනවා.

එහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපතිවරයා මෙසෙද කීය.

කටුනායක ගුවන් තොටුපොළ කාර්යබහුලවීම හා කොරෝනා වයිරසය හේතුවෙන් ඊට සෞඛ්‍ය ආරක්ෂණ පියවරක් ලෙස ශ්‍රමිකයින් මත්තල වීකල්ප පාත්‍යන්තර ගුවන් තොටුපොළින් විදේශ රැකියා සඳහා මෙම අවස්ථාවේ යොමුකිරීමට කටයුතු කළා. අපට ලැබෙන සෑම අවස්ථාවකම මෙම වීකල්ප ගුවන්තොටුපොළ විදේශ ශ්‍රමිකයන් විදේශගත කිරීමට භාවිත කරනවා.

මෙම අවස්ථාවට එක්වූ මත්තල රාජපක්ෂ අන්තර්ජාතික ගුවන්තොටුපොළේ කළමනාකරු උපුල් කලංසූරිය මහතා සඳහන් කළේ, විදේශ සේවා නියුක්ති කාර්යාංශය සහ ගුවන් තොටුපොළ හා ගුවන් සේවා සමාගම එක්ව විදේශ රැකියාලාභීන් විශාල වශයෙන්, මත්තල ගුවන් තොටුපොළින් ගුවන් ගත කිරීමට සැලසුම් කර තිබෙන බවය. වාර්තාවලට අනුව, මත්තල ගුවන් තොටුපොල අවට දිස්ත්‍රික්කවලින් 30% ක් පමණ විදේශ ගත වී ඇති බවත්, ඉදිරියේදී ඔවුන්ගේ ගුවන් ගමන් පහසුකම් මත්තල ගුවන් තොටුපොළින් ලබාදීමට බලාපොරොත්තු වන බවද සඳහන් කළේය.

මෙම අවස්ථාවට විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ උප සභාපති නිමල් තිබ්බොටුමුනුව, කොරියානු මානව සම්පත් සංවර්ධන ආයතනයේ මෙරට නේවාසික අධ්‍යක්ෂක කිම් වොන් සොක් සහ කාර්යාංශයේ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී (බඳවාගැනීම්, පුහුණු හා අලෙවිකරණ) මංගල රන්දෙණිය යන මහත්වරු ඇතුළු පිරිසක් එක්ව සිටියහ.

# විදේශ දූත මණ්ඩල 14 ක කම්කරු සුභසාධන අංශ 16කට රුපියල් 500,000 බැගින් ලක්ෂ 80 ක මූල්‍ය ප්‍රතිපාදන වෙන් කරයි.

විදේශ රැකියාවල නිරත වී සිටින විගමනික ශ්‍රමිකයන් කොවිඩ් 19 වසිරුසය ලොව පුරා පැතිරයාමත් සමග විවිධ අපහසුතාවයන්ට පත්වී ඇති බැවින් ඔවුන්ගේ අවශ්‍යතා සපුරාලීම් සඳහා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින්, රටවල් 14 ක පිහිටි කම්කරු සුභසාධන අංශ 16 කට රුපියල් 500,000 බැගින් රුපියල් ලක්ෂ 80 ක් ලබාදී තිබේ.

ඒ අනුව එක්සත් අරාබි එමිර් රාජ්‍යය (අබුඩාබි හා ඩුබායි), බහරේන්, සයිප්‍රස්, ඊශ්‍රායෙල්, ජෝර්ඩාන්, කුවේට්, ලෙබනන්, මැලේසියා, ඕමාන්, මාලදිවයින්, කටාර්, සෞදි අරාබිය (රියාද් හා ජෙඩා), දකුණු කොරියාව හා සිංගප්පූරුව යන විදේශ දූත මණ්ඩලවල පිහිටි කම්කරු සුභසාධන අංශ 16 ට මෙම මුදල් ලබා දී තිබේ. මෙයට අමතරව දැනටමත් ඒ ඒ කම්කරු සුභසාධන අංශවල තිබෙන කාර්යාංශයේ කම්කරු සුබසාධන අරමුදල මගින්ද (**Workers Welfare Fund**) අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන ලබාගැනීමටද අනුමැතිය ලබා දී ඇත.


ඔබ සොයන්නේ
විදේශ රැකියාවක්ද
එන්න අප වෙත
අපගේ වෙබ් අඩවියේ
ONLINE JOB BANK
වෙත පිවිස
අදම ලියාපදිංචි වන්න.
www.slbfe.lk




# විගමනික ශ්‍රමිකයන් වෙනුවෙන් රු.මිලියන 50ක ඉතිරිකිරීමේ ගිණුම්

විදේශ රැකියා සඳහා පිටත්වීමට බලාපොරොත්තු වන විගමණික ශ්‍රමිකයන් වෙනුවෙන් රුපියල් මිලියන 50ක විශේෂ තැන්පතු ගිණුම් ආරම්භ කිරීම සඳහා විදේශ සබඳතා, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා විසින් ඉදිරිපත් කරන ලද යෝජනාවට විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ මණ්ඩලය සිය පූර්ණ සහයෝගය දැක්වීමට තීරණය කළ බව කාර්යාංශයේ සභාපති කමල් රත්වත්තේ මහතා සඳහන් කරයි. 2020.06.16 දිනට යෙදෙන, එක්සත් ජාතීන්ගේ සංවිධානය මගින් ප්‍රකාශයට පත්කර ඇති ''විගමණික පවුල හා සම්බන්ධ ජාත්‍යන්තර ප්‍රේෂණ දිනය'' (**International Day of Family Remittances Day**) වෙනුවෙන් මෙම වැඩසටහන ක්‍රියාත්මක කෙරිණි.

පළමුව නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන මෙම වැඩසටහන යටතේ, විදේශ රැකියා සඳහා පිටත්වීමට බලාපොරොත්තු වන විගමණික ශ්‍රමිකයන්, කාර්යාංශයේ ලියාපදිංචි කිරීමේදී ඔවුන්ගේ නමින් විශේෂ ප්‍රේෂණ තැන්පතු ගිණුමක් විවෘත කර ඒ සඳහා ඩොලර් 5ක මූලික මුදලක් කාර්යාංශය විසින් තැන්පත් කෙරිණි. ලංකාවේ වාණිජ බැංකු කිහියක් සම්බන්ධ කරගෙන ක්‍රියාත්මක කිරීමට බලාපොරොත්තු වන මෙම වැඩසටහනට අනුව, එම බැංකු මගින්ද අදාල ශ්‍රමිකයාගේ ගිණුමට තවත් ඩොලර් 5 තැන්පත් කිරීමට එම බැංකු වෙතද යෝජනා කෙරෙයි.

විදේශ රැකියාවෙන් උපයාගනු ලබන විදේශ විනිමයට රාජ්‍ය සුරක්ෂිතභාවය ලබාදෙමින් තම මාසික වේතන තමන්ගේ නමින් මෙම ගිනුමට බැර කිරීම මගින් මාසිකව ඩොලර් 20 සිට 100 දක්වා ඉතිරි කිරීමට ශ්‍රමිකයන් දිරිගැන්වීම උනන්දු කිරීම මෙහි ප්‍රධාන අරමුණයි.

එසේම මෙලෙස නීත්‍යානුකූල මාර්ගයෙන් රටට ලැබෙන විදේශ විනිමය ප්‍රමාණය ඉහළ නැංවීම මගින් රටේ විදේශ විනිමය සංචිත ප්‍රමාණය ඉහළ නැංවීමද බලාපොරොත්තුවේ. එමගින් රටේ සමස්ත ජනතාවටම ප්‍රතිලාභ හිමිවන බව කමල් රත්වත්තේ මහතා සඳහන් කරයි. මෙම වැඩසටහනේ සඳහා ඉදිරියේදී ලියාපදිංචි විදේශ රැකියා නියෝජිතායතනවල සහය ලබාගැනිමටද බලාපොරොත්තුවේ.

මෙම වැඩසටහන දීර්ඝකාලීනව ක්‍රියාත්මක වීම මගින් විගමනික ශ්‍රමිකයාගේ ඉතිරිකිරීම් වැඩිකෙරෙන අතර, රට තුළ විදේශ සංචිත ප්‍රමාණයද ස්ථාවර මට්ටමකට ගෙන වීම බලාපොරොත්තු වන අතර එමගින් විගමණික ශ්‍රමිකයන්ට විශේෂ වරප්‍රසාද රාශියක් වාණිජ බැංකු හරහා ලබාදීමට බලාපොරොත්තුවේ.

පළමුව නියමු ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක වන මෙම වැඩසටහන යටතේ විදේශ රැකියා සඳහා පිටත්වීමට බලාපොරොත්තු වන විගමණික ශ්‍රමිකයන් 50,000ක පමණ සම්බන්ධ කරගැනීමට කාර්යාංශය අපේක්ෂා කරයි.

# කොවිඩ් 19 වසංගතය හේතුවෙන් පීඩාවට පත් විගමණික ශ්‍රමිකයන්ට උපකාර කළ හැකි ක්‍රම සහ ක්‍රියාමාර් කඩිනමින් ගැනීමට අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාගෙන් උපදෙස්

(2020.04.28 - නාරාහේන්පිට)

කොවිඩ් 19 වසංගතය හේතුවෙන් විගමණික ශ්‍රමිකයන් ඇතුළු ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන් මුහුණ දෙන වර්තමාන ගැටලු පිළිබඳව අධ්‍යයනය කිරීම සහ ඔවුන්ට සහ ශ්‍රී ලංකාවේ බලපෑමට ලක්වූ ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට උපකාර කළ හැකි ක්‍රම සහ ක්‍රියාමාර් ගැනීමට අදාල සාකච්ඡාවක් විදේශ සබඳතා, නිපුණතා සංවර්ධන, රැකිරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාගේ ප්‍රධානත්වයෙන් රේයේ (2020.04.17) නාරාහේන්පිට පිහිටි අමාත්‍යාංශයේදී පැවැත්විණි. මෙම සාකච්ඡාව අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු නිලධාරීන් සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති ඇතුළු උසස් නිලධාරීන් සමග පැවැත්විණි.

මෙහිදි ශ්‍රී ලංකා දූත මණ්ඩල 16 ක කම්කරු සුභසාධන අංශ විසින් සකස් කරන ලද වසංගතයෙන් පීඩාවට පත්ව සිටින විගමනික ශ්‍රමිකයන් සම්බන්ධ දත්ත වාර්තාවක් සාකච්ඡාවට ගැනිණි. එම වාර්තාවට අනුව පීඩාවට පත්ව සිටින විගමනික ශ්‍රමිකයන් සහ ඔවුන්ගේ පවුල් හඳුනා ගැනීමට නිලධාරීන්ට අමාත්‍යවරයා උපදෙස් ලබා දී තිබේ. මෙම වසංගත කාලය තුළ සැබවින්ම ආධාර ලැබීමට සුදුස්සන් කවුද යන්න තීරණය කර වහාම ඔවුන්ට සහාය වීම සඳහා සාධාරණ හා වීනිවිද පෙනෙන යාන්ත්‍රණයක් සැකසීමටද තීරණය වී තිබේ.

එමෙන්ම දැනට රැකියා අහිමි වී ඇති ශ්‍රමිකයන් සම්බන්ධව අදාල සේවා ස්ථානවල සේවා යෝජකයන් සම්බන්ධ කර ගැනීමටත්, එම සේවකයන්ගේ සුභසාධනය, ආරක්ෂාව සහ මූලික අවශ්‍යතා සපුරාලන්නේ කෙසේදැයි සොයා බැලීමටත් ශ්‍රී ලංකා තානාපති කාර්යාලවල කම්කරු සුබසාධන අංශවලට අනුයුක්ත කාර්ය මණ්ඩලයට දැනුම් දෙන ලෙස අමාත්‍යවරයා අදාල නිලධාරීන්ට උපදෙස් දුන්නේය.

මෙම සාකච්ඡාව සඳහා නිපුණතා සංවර්ධන, රැකිරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශයේ ලේකම් සරත් අබේගුණවර්ධන, අතිරේක ලේකම් යමුනා පෙරේරා, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ සභාපති කමල් රත්වත්තේ, සාමාන්‍යාධිකාරී ඩබ්ලිව්.එම්.ඒ.වන්සේකර යන මහත්ම මහත්මීන් ඇතුළු උසස් නිලධාරිහු එක්ව සිටියහ.

# ශ්‍රී ලංකාව මුහුණ දෙන ආර්ථික පසුබෑම වැළැක්වීමට විගමනික ශ්‍රමිකයන්ගේ විශිෂ්ට දායකත්වය

සමස්ත ලෝකයම දැවැන්ත ආර්ථික පරිහානියකට ලක්ව ඇති මෙම අවස්ථාවේ, ශ්‍රී ලංකාවද ඉදිරියේ දී මුහුණපෑමට යන ආර්ථික පසුබෑම ඉතා භයානක තත්වයකට යාමට ඉඩ තිබීම වළක්වාලීමට නම්, විගමනික ශ්‍රමිකයන්ගේ විශිෂ්ට දායකත්වය, තම මවුවීම වෙනුවෙන් ඉතාම වැදගත් බව විදේශ සේවා නියුක්ති කාර්යාංශය ගෞරවයෙන් ප්‍රකාශ කරයි.

මේ දක්වා විගමනික ශ්‍රමිකයන් ශ්‍රී ලංකාවේ ආර්ථිකය ඉහළ නංවන්නට ලබාදුන් මහඟු දායකත්වය ඉතා අගයකොට සළකන අතර ඉදිරි වසර දෙක තුන ඇතුළත විදේශ විනිමය විශාල ප්‍රමාණයක් දේශයේ ආර්ථික හා සමාජ සංවර්ධනයට අත්‍යවශ්‍ය වන බව සඳහන් කරමු. ඒ අනුව සෞඛ්‍ය සේවය, ළමයින්ගේ අධ්‍යාපනය, කෘෂිකාර්මික කටයුතු සඳහා පොහොර සහනාධාරය, පොදු ප්‍රවාහන සේවාව, ග්‍රාමීය යටිතල පහසුකම් නැංවීම වැනි මෙකී නොකී කුදුමහත් දැවැන්ත සංවර්ධන කටයුතු ඉදිරියට අඛණ්ඩව කරගෙන යාමට විශාල මුදලක් වැයකිරීමට සිදුවේ.

මෙම කර්තව්‍යයට සෘජුවම දායක වන විදේශ ගත ශ්‍රමිකයන්වන ඔබ, දුක්මහන්සියෙන් උපයන විදේශ විනිමය මහත්සේ බලපානු ඇත. මෙම ජාතික මෙහෙවරට විගමනික ශ්‍රමිකයන් වශයෙන් ඔබ ලබාදෙන දායකත්වය ඉදිරියේ දී අනිවාර්යයෙන්ම දේශයේ ඇගයීමට ලක්වීම නොඅනුමානය.

මෙම ජාතික මෙහෙවර මේ පිළිබඳව තවදුරටත් විදේශගත ශ්‍රමිකයන්ගේ ඥාතීන් හා පවුලේ සාමාජිකයන් විසින්, විදේශ රැකියාවේ නිරතව සිටින තම ඥාතියා දිරිගැන්වීමට මේ අවස්ථාවේදී සිදුකරන මෙහෙයද අප අගයකොට සළකමු.

අපි සියලු දෙනා එක්ව, අපි අපේ රට ගොඩනගමු

කමල් රත්වත්තේ
සභාපති
ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය

# කොවිඩ් 19 හෙවත් කොරෝනා වෛරසය පැතිරයාම හේතුවෙන් රට රැකියාවලට යන ශ්‍රී ලාංකිකයන්ට උපදෙස් හා යෝජනා...



මේ වන විට ලෝකය පුරා වේගයෙන් පැතිර යමින් පවතින කොවිඩ් 19 හෙවත් කොරෝනා වෛරසය හේතුවෙන්, මැද පෙරදිග රටවල් ඇතුළු වෙනත් රටවල විදේශ රැකියා සඳහා යොමුවීම සම්බන්ධයෙන් ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් සිදුකරනු ලබන මාධ්‍ය නිවේදනය පහතින් දැක්වේ.

අද වන විට ලෝකයේ රටවල් එකසිය පහළොවකට (115) අධික සංඛ්‍යාවක කොරෝනා වෛරසය පැතිර ඇති අතර, ඉන් ආසාධිතයන් සංඛ්‍යාව ලක්ෂයද ඉක්මවා තිබේ. වෛරසය වැළඳුණු පුද්ගලයන් හාර දහසකට අධික ප්‍රමාණයක් මේ වන විට මීය ගොස් ඇති බවට ලෝක සෞඛ්‍ය සංවිධානය වාර්තා කර ඇත. කොරෝනා වයිරසයේ ව්‍යාප්තිය හා බලපෑම සලකා ලෝක සෞඛ්‍ය සංවිධානය විසින්, ලොව පුරා හදිසි තත්ත්වයක්ද ප්‍රකාශයට පත් කොට තිබේ.

ශ්‍රී ලාංකිකයන් වැඩි වශයෙන් රැකියා සඳහා පිටත් වන මැදපෙරදිග ඇතුළු ආසියා හා යුරෝපීය රටවල් කොරෝනා වයිරසයේ බලපෑමට ලක් වී ඇත. ඒ අනුව මේ වන විට කටාර් හා කුවේට් රාජ්‍යයන් තම රටට පැමිණෙන ගුවන් ගමන් තාවකාලිකව අත්හිටුවා ඇති අතර, සෙසු රටවල්ද ඉදිරියේදී මෙම පියවර ගැනීමට ඉඩ තිබේ. කොරෝනා වෛරසයේ ව්‍යාප්තිය සලකා බලා නිපුණතා සංවර්ධන, රැකී රක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යාංශය සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය සමග බලපත්‍රලාභී විදේශ රැකියා නියෝජිතයන්ගේ සංගමයද (**ALFEA**) ශ්‍රී ලාංකිකයන් මෙම තත්ත්වයෙන් ආරක්ෂා කර ගැනීම මූලික අරමුණ කොට ගෙන අදාළ රටවල රැකියා සඳහා පිටත්වීම තාවකාලිකව කල් දැමීම සුදුසු යැයි යෝජනා කොට සිටී.

මෙයට අමතරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින්, කොරෝනා වෛරසය පැතිර ඇති ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සේවය කරන රටවල තානාපති කාර්යාලයන්හි කම්කරු අංශ වෙත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සම්බන්ධයෙන් අවශ්‍ය පියවර ගන්නා ලෙස දැනටමත් සියලු උපදෙස් ලබා දී තිබේ. ඒ අනුව තොරතුරු ලබාගැනීම සඳහා එම රටවල තානාපති කාර්යාල විශේෂ දුරකථන අංක හඳුන්වා දී තිබේ. මීට අමතරව ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ 1989 ක්ෂණික ඇමතුම් අංකය ඇමතීමෙන්ද අවශ්‍ය උපදෙස් ලබාගත හැකිය.

එසේම දැනට විදේශගතව සේවය කරන ශ්‍රී ලාංකිකයන් හා විදේශ ගතවීමට අපේක්ෂිත ශ්‍රී ලාංකිකයන් සම්බන්ධව ඉදිරි තීරණ ගනු ලබන්නේ ඒ ඒ රටවල අදාළ බලධාරීන් විසින් ලබාදෙන උපදෙස්වලට අනුව බව මෙයින් දැනුම් දෙනු ලැබේ. එසේම ශ්‍රමිකයන් එම රටවල රැකියාවලට යොමුවන්නේ හමී, සෞඛ්‍ය අංශවල උපදෙස් තරයේ පිළිපදින මෙන්ද කාර්යාංශය රැකියා ලාභීන්ගෙන් ඉල්ලා සිටියි.